OL/2017/62/S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය | I, II | පැය තුනයි |
| குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் | I, II | மூன்று மணித்தியாலம் |
| Citizenship Education & Governance | I, II | Three hours |

විභාග අංකය :.............................

## පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

● අංක **1** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා, **තිත් ඉර මත** ලියන්න.

**1.** සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් වූ 'ප්‍රාරම්භනය' ක්‍රියාත්මක වන රටක් ලෙස ...................................... සැලකේ.
(බ්‍රිතාන්‍යය/ප්‍රංශය/ස්විට්සර්ලන්තය)

**2.** ...................................... ද්වි පක්ෂ ක්‍රමයක් පවතින රටකි.
(ඉන්දියාව/බ්‍රිතාන්‍යය/චීනය)

**3.** සෙසු සමාජ ජීවීන්ට හානියක් නොවන පරිදි තම සිතැඟි ඉටු කර ගැනීම සඳහා පුද්ගලයාට බාහිර පරිසරයෙන් ලැබෙන අනුග්‍රහය ...................................... ලෙස හැඳින්වේ.
(නිදහස/සමානාත්මතාව/අයිතිවාසිකම්)

**4.** වෙන් කරන ලද භූමි ප්‍රදේශයක් තුළ අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය උත්තරීතර බලයක් සහිත මිනිස් සමාජයක් ...................................... ලෙස හැඳින්වේ.
(රාජ්‍යය/ආණ්ඩුව/ගෝත්‍රය)

**5.** ජාතික රාජ්‍ය බිහි වීමේ මූලික අවස්ථාව .................................................... ලෙස සැලකේ.
(ග්‍රීක පෞර රාජ්‍යය/වැඩවසම් රාජ්‍යය/ගෝත්‍ර රාජ්‍යය)

**6.** ඇමෙරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය ...................................... නමින් හඳුන්වනු ලැබේ.
(පාර්ලිමේන්තුව/කොංග්‍රස් මණ්ඩලය/ජාතික සභාව)

**7.** බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගතකරණය සම්බන්ධයෙන් ගත් පළමු පියවර ලෙස .................... .................................. සැලකිය හැකි ය.
(මහ නගර සභා ආඥා පනත/ගම් කාර්ය සභා ආඥා පනත/විධායක කාරක සභාව)

**8.** 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධ සියලු කාර්යයන් අයත් වන්නේ .................... ........................ ලැයිස්තුවට ය.
(පළාත් සභා/සංචෘත/සමගාමී)

**9.** පළාත් සභාවක ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ .................................................... ය.
(පළාත් ආණ්ඩුකාරවරයා/පළාත් ලේකම්/මහ ඇමති)

**10.** ක්‍රි.ව. 105 දී චීනයේ ආරම්භ වූ කඩදාසි නිෂ්පාදනය ලොව අනෙකුත් රටවල් අතර වේගයෙන් පැතිරයාම සිදු විය. මෙය .................................. විසරණයට නිදසුනක් ලෙස දැක්විය හැකි ය.
(සෘජු/අන්තර් සම්බන්ධතා/ප්‍රබෝධාත්මක)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

- අංක **11** සිට **20** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති **වරහන තුළ** ලකුණු කරන්න.

**11.** ඊශ්‍රායලය ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොමැති රටකි. (………)

**12.** නීත්‍යානුකූලව හැසිරීම හා නීතිය ආරක්ෂා කිරීමට සහයෝගය ලබා දීම සදාචාරාත්මක යුතුකම් ගණයට අයත් වේ. (………)

**13.** භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අන්තර් භාණ්ඩ පාවිච්චි කළ හැක්කේ එක් වතාවක් පමණක් වීම එහි විශේෂ ලක්ෂණයකි. (………)

**14.** සමාජවාදී අර්ථක්‍රමයක් පවතින රටවල නිෂ්පාදන සම්පත්වල අයිතිය රජය සතු වේ. (………)

**15.** ඍණ බාහිරතා ගැන අවධානය යොමු නොකිරීම වෙළෙඳපොළ අර්ථ ක්‍රමයේ හිතකර ලක්ෂණයකි. (………)

**16.** ගැටුම් විසඳා ගැනීමේ හොඳම ක්‍රමය ගැටුම්වලින් උපක්‍රමශීලීව මඟහැර යාමයි. (………)

**17.** පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් සමාජයට එරෙහිව කරනු ලබන වැරදි සම්බන්ධයෙන් බලපාන නීතිය අපරාධ නීතිය ලෙස සැලකේ. (………)

**18.** 'තේසවලාමෙයි' නීතියට අනුව ස්වාමිපුරුෂයාට බිරිඳගේ අවසරය නොමැතිව වුව ද දේපළ විකිණීම හෝ උකස් කිරීම කළ හැකි ය. (………)

**19.** ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන ලද නඩු තීන්දුවකට විරුද්ධව එංගලන්තයේ රාජාධිකරණයට අභියාචනා කළ හැකි ය. (………)

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමේ කාර්යය හා බලතල ශ්‍රී ලංකාවේ අධිකරණය සතු වේ. (………)

- අංක **21** සිට **30** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

**21.** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක් සම්මත වීමෙන් පසු ……………………………………… අත්සන් තැබීමෙන් අනතුරුව නීතියක් බවට පත් වේ.

**22.** විධායක කාරක සභා ක්‍රමය ඇති කරන ලද්දේ ……………………………………… ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.

**23.** වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් වූ බැඳීම ……………………………………… නම් වේ.

**24.** මානව අයිතිවාසිකම් වර්ග කිරීමට අනුව නීත්‍යානුකූල රැකියාවක යෙදීමේ අයිතිය ……………………………………… අයිතිවාසිකම් ගණයට අයත් වේ.

**25.** කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය ……………………………………… නමින් හැඳින්වේ.

**26.** පස, ජලය, වායුව ආදිය පරිසරයේ නිර්මාණය වී ඇති ……………………………………… සංරචක ගණයට අයත් වේ.

**27.** 'දළ ජාතික නිෂ්පාදිතය' සංවර්ධනය මැනීමේ දී භාවිත වන ……………………………… මිනුම් ගණයට අයත් වේ.

**28.** රාජ්‍ය උපාය සම්බන්ධතා හා ……………………………………… සම්බන්ධතා ලෙස, ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රධාන අංශ දෙකකට බෙදේ.

**29.** යුද්ධමය අරමුණු මත සෝවියට් රුසියාව ප්‍රමුඛ නැගෙනහිර යුරෝපා රටවල් පිහිටුවාගත් සංවිධානය ……………………… ……………………… නමින් හැඳින්වේ.

**30.** සාර්ක් සංවිධානයේ සමාජික රටවල් අතර නිදහස් වෙළෙඳ කලාපයක් ඇති කිරීමේ අරමුණින් ඇති කරගත් ගිවිසුම ……………………………………… නමින් හැඳින්වේ.

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** රටවල් දෙකක් අතර භූමිය පිළිබඳ අයිතිය නිරවුල් කිරීම සඳහා ජනතා කැමැත්ත විමසීමට බහුලව භාවිත කෙරෙන සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමය වන්නේ,
(1) ජනමත විචාරණයයි. (2) ප්‍රාරම්භනයයි.
(3) පුනරාවර්තනයයි. (4) ප්ලේබිසයිට් ක්‍රමයයි. (......)

**32.** මිනිසා විසින් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගනු ලබන නිෂ්පාදන ආධාරක හඳුන්වනු ලබන්නේ,
(1) භූමිය ලෙස ය. (2) ශ්‍රමය ලෙස ය.
(3) ප්‍රාග්ධනය ලෙස ය. (4) ව්‍යවසාය ලෙස ය. (......)

**33.** වර්තමානයේ බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීමට ප්‍රබල ලෙස බලපාන සාධකය/සාධක ලෙස සැලකිය හැක්කේ,
(1) ගෝලීයකරණය හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි.
(2) සංචාරක ව්‍යාපාරයේ දියුණුවයි.
(3) රටවල් අතර සිදුවන ජනසංක්‍රමණයි.
(4) අලුත් සංස්කෘතික අංග වැළඳ ගැනීම විලාසිතාවක් වී තිබීමයි. (......)

**34.** ඉස්ලාම් නීතියේ කේන්ද්‍රීය මූලාශ්‍රය වන්නේ,
(1) ඉජ්මා ය. (2) කියාස් ය. (3) අල්-කුර්-ආන් ය. (4) අල්-හදීස් ය. (......)

**35.** ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
(1) අග්‍රවිනිශ්චයකාරවරයා ය. (2) නීතිපතිවරයා ය.
(3) සොලිසිටර් ජනරාල්වරයා ය. (4) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ය. (......)

**36.** 'තේසවලාමෙයි' නීතියට අදාළ වන දේපළ පිළිබඳව නිවැරදිව සඳහන් වන ප්‍රකාශය තෝරන්න.
(1) ද්‍රවිඩ වැසියන් සතුව උතුරු පළාතට අයත් ප්‍රදේශවල පිහිටි දේපළ අදාළ වේ.
(2) ද්‍රවිඩ වැසියන් සතුව යාපන අර්ධද්වීපයෙහි පමණක් පිහිටි දේපළ අදාළ වේ.
(3) උතුරු පළාතේ වාසය කරන සියලු ම වැසියන්ට අයත් දේපළ අදාළ වේ.
(4) ශ්‍රී ලංකාවේ සියලු ම ද්‍රවිඩ වැසියන්ට අයත් දේපළ අදාළ වේ. (......)

**37.** මහාධිකරණයට සිය අධිකරණ බලය යටතේ විභාග කළ හැකි නඩු වර්ගයක් වන්නේ,
(1) ආදායම් පිළිබඳ නඩු ය. (2) විවාහ සම්බන්ධ නඩු ය.
(3) වස්තු භංගත්ව පිළිබඳ නඩු ය. (4) රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ පිළිබඳ නඩු ය. (......)

**38.** ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකමක් වන්නේ,
(1) කැමති ආගමක් ඇදහීමට ඇති නිදහසයි.
(2) නිදහස් මත දැරීමේ අයිතියයි.
(3) නොමිලයේ අනිවාර්ය අධ්‍යාපනය ලැබීමට ඇති අයිතියයි.
(4) පෞද්ගලික ආරක්ෂාවට ඇති අයිතියයි. (......)

**39.** ස්වාභාවික ක්‍රියාකාරකම් නිසා බොහෝ විට හටගන්නා පාරිසරික ගැටලුවක් වන්නේ,
(1) පස ලවණීකරණය වීමයි. (2) ලැව් ගිනි හට ගැනීමයි.
(3) අම්ල වැසි ඇති වීමයි. (4) කොරල්පර විනාශ වීමයි. (......)

**40.** තිරසාර සංවර්ධනය සඳහා සම්පත් පරිහරණයේ දී වඩා වැදගත් වන්නේ,
(1) 3R සංකල්පය ක්‍රියාවේ යෙදවීමයි.
(2) භාවිතය හා සංරක්ෂණයයි.
(3) ඵලදායීතාව වර්ධනය කිරීමයි.
(4) නීති රීති දැඩි කිරීමයි. (......)

* *

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I, II
குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் I, II
Citizenship Education & Governance I, II

## පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක **නොවීමට** හේතු **දෙකක්** දක්වන්න.
(ii) බහු පක්ෂ ක්‍රමයක් පවතින රටවල් **දෙකක්** නම් කරන්න.
(iii) ශ්‍රී ලංකාවේ ඡන්දදායකයකු වීම සඳහා පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් **දෙකක්** සඳහන් කරන්න.
(iv) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා මිනිසා විසින් කරන ලද විප්ලව **දෙකක්** නම් කරන්න.
(v) සන්ධීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(vi) ස්විට්සර්ලන්තයේ 'කැන්ටන්' හෙවත් 'ප්‍රාදේශීය පාලන ඒකක' වෙත පවරා ඇති බලතල **දෙකක්** සඳහන් කරන්න.
(vii) ධනවාදී අර්ථ ක්‍රමයේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
(viii) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න.
(ix) පරිසරය සකස් වී ඇති ප්‍රධාන සංරචක **දෙක** නම් කරන්න.
(x) සංවර්ධනය මැනීමට භාවිත කරන නූතන මිනුම් **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** (i) රාජ්‍යයක අංග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ජාතික රාජ්‍ය නිර්මාණයේ දී බලපෑ හේතු සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක කර ගැනීම සඳහා පුරවැසියකු කටයුතු කළ යුතු ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** (i) අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ සියලු ම ජන කොටස් එකිනෙකාට සහයෝගයෙන් කටයුතු කර ඇති බවට නිදසුන් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ii) බහු සංස්කෘතික සමාජයක විවිධ ජන කොටස් එකමුතුව කටයුතු කිරීමෙන් අත්වන වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) මිනිසාගේ පැවැත්මට අනිවාර්යයෙන් ම තිබිය යුතු මූලික අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා ඕනෑම ආර්ථිකයක් තුළ සිදු කෙරෙන කටයුතු වර්ග තුනකට බෙදිය හැකි ය. එම වර්ග **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) ගෝලීයකරණය ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

5. (i) නීතියේ තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) නීතිපතිතුමා සතු බලතල **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
(iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර **තුනක්** සඳහන් කර ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

6. (i) සංවර්ධනය මැනීමේ පරමාර්ථ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන සම්ප්‍රදායික මිනුම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) තිරසාර සංවර්ධනයක් උදෙසා පුරවැසියන් වශයෙන් පරිසරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

7. (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) මූලික අයිතිවාසිකම් පිළිබඳ යම් යම් සීමා පැනවීමේ හැකියාව රජය සතු වේ. එසේ සීමා පැනවීමට සිදුවන අවස්ථා **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
(iii) පුද්ගලයකු විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකම් **තුනක්** සඳහන් කර ඉන් **එකක** වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/